# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1867/7 - 2014 ජූනි මස 17 වැනි අඟහරුවාදා - 2014.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 3/3/2/35.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2006/E/494.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහපත්තුව සුළු කොට්ඨාසයේ, කිරිවත්තුඩුව ගමේ මැනුම්පති විසින් පිළියෙළ කර ඇති අංක 9271 සහ 2013.07.04 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් සඳහන් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.4060 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කොටසට මායිම්:

**කැබලි අංක 01**

ඉඩමේ නම: යකහළුකැලේ; විස්තරය: වත්ත, රබර් වගාවක් ඇත; හිමිකම් කියන අය: එස්. ඒ. ඩී. ඩයස්, අංක 17, පිරිවෙන පාර, ගල්කිස්ස; ප්‍රමාණය: හෙක්. 0.4060.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 අගෝස්තු මස 21 වැනි දින පෙ. ව. 10.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 අගෝස්තු මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබද විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ජී. එස්. කේ. කන්නන්ගර,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2014 ජූනි මස 13 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 34

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ජීසීඑෆ්/අත්/CB/47/එල්ආර්.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 3/J/90/එල්ආර්බී/184.

මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ටොරින්ටන් ඇල අසල වගුරු බිම් සංවර්ධනය සඳහා පහත විස්තර කර ඇති ඉඩම රජයට පවරාගෙන ඇතිබව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*රජයට පවරා ගන්නා ලද ඉඩමේ විස්තර :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිඹිරිගස්යාය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ (කොට්ඨාස අංක 40 - කොළඹ මහ නගර සභා සීමාව තුළ) තිඹිරිගස්යාය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2014 මැයි මස 02 දිනැතිව පිළියෙල කර ඇති අංක 9363 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0379 ක් වන පහත විස්තර කර ඇති ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කජුගස්ඕවිට; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0379

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පැවරූ අයවලුන් 2014 අගෝස්තු මස 11 වැනි දින පෙ. ව. 10.00 ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පිහිටා ඇති මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතියේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 ජූලි මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සී. ඩබ්ලිව්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය,
අත්කර ගැනීමේ නිලධාරී කාර්යාලය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ,
රාජගිරිය.

07 - 35

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.